රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:-16/2005

මගේ අංකය:ආ/4/3/3/2-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2005 සැප්තැම්බර් මස 20 දින

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්

## කැබිනට් අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම් සහ මහජන සම්බන්ධතා නිලධාරී තනතුරු සඳහා දීමනා

1991.07.20 දිනැති 29/91 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

02. ගරු අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරුන්, සම්බන්ධීකරණ ලේකම්වරුන්, මාධ්‍ය ලේකම්වරුන් සහ මහජන සම්බන්ධතා නිලධාරීන්ට යථෝක්ත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ගෙවනු ලබන දීමනා 2005 සැප්තැම්බර් මස 01 දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

| | පරිවර්තිත අතිකාල දීමනා | සංග්‍රහ දීමනා |
|---|---|---|
| ගරු අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරු | 2500/- | 1000/- |
| ගරු අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සම්බන්ධීකරණ නිලධාරීන් | 1500/- | - |
| ගරු අමාත්‍යවරුන්ගේ මාධ්‍ය ලේකම්වරු | 1500/- | - |
| ගරු අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ මහජන සම්බන්ධතා නිලධාරීන් | 1500/- | - |
| ජනාධිපති ලේකම්/අග්‍රාමාත්‍ය ලේකම්/අමාත්‍ය මණ්ඩල ලේකම් සහ කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරු | 1500/- | - |

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය